CP/AL/2026/54-I

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අ.පොස (උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2026

පෙරදිග සංගීතය I	54 S I	13 ශ්‍රේණිය	පැය දෙකයි

උපදෙස් -

- සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 30 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ ඉතාම ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහන තුළ ලියන්න.
- අංක 30 සිට 50 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.

1. යමකිසි රාගයක ආරෝහණ ,අවරෝහණ ස්වරූපය මෙසේය.
   ස නිධනිස , මගු, මධ නිධ ,ස - ස්නිධ ,මගු, මගුරිස
   ඒ අනුව මෙම රාගයේ ජාතිය කුමක් ද?
   (1) ඖඩව - ෂාඩව ජාතිය
   (2) ඖඩව - සම්පූර්ණ ජාතිය
   (3) ෂාඩව - සම්පූර්ණ ජාතිය
   (4) ඖඩව ජාතිය
   (5) ෂාඩව ජාතිය
   (.....)

2. මෙල 10 ය පිළිබඳව හඳුන්වාදුන් සංගීතඥයා ගේ නම තෝරන්න.
   (1) මාතංග මුණි
   (2) රාමා මාත්‍ය
   (3) භාත්ඛණ්ඩේ පඩිතුමා
   (4) ව්‍යංඛට මුඛි
   (5) ශ්‍රී නිවාස්
   (.....)

3. සංගීතය , නර්තනය යන කලාවන් තුළ පොදුවේ භාවිත සංගීත මූලධර්මයක් වන්නේ,
   (1) රාග තාලය වේ.
   (2) මෙල රාග ක්‍රමය වේ.
   (3) අභිනය වේ.
   (4) රිද්මය වේ.
   (5) ස්වර වේ.
   (.....)

4. සරෝද් , සිතාර් වැනි සංගීත භාණ්ඩ වාදනයේ දී එක් ස්වරයක සිට තවත් ස්වරයක් දක්වා හඬ නොකඩවා පවත්වාගෙන යාම පිළිවෙළින් හඳුන්වන්නේ ,
   (1) ආන්දෝලන - ජෝඩ් වශයෙනි.
   (2) මීන්ඩ් - සූත් වශයෙනි.
   (3) සූත් - ආන්දෝලන වශයෙනි.
   (4) සූත් - මීන්ඩ් වශයෙනි.
   (5) මීන්ඩ් - ආන්දෝලන වශයෙනි.
   (.....)

5. සප්තකයේ පූර්ව භාගයේ වාදී ස්වරය පිහිටන රාග මේ නමින් හඳුන්වයි.
   (1) පූර්වාංග වාදී රාග
   (2) උත්තරාංග වාදී රාග
   (3) සන්ධි ප්‍රකාශ රාග
   (4) පරමේල ප්‍රවේශක රාග
   (5) උදය සන්ධි ප්‍රකාශ රාග
   (.....)

6. රාගයක් ඉදිරිපත් කිරීමේ දී නිර්මාණාත්මකව ක්ෂණිකව ගොඩනගා ගන්නා නාද විග්‍රහ හඳුන්වනු ලබන්නේ කුමන නමකින්ද?
   (1) මුර්කි ලෙසය.
   (2) කන් ලෙසය.
   (3) ගමක් ලෙසය.
   (4) මීන්ඩ් ලෙසය.
   (5) උපජ් ලෙසය.
   (.....)

7. ශාස්ත්‍රීය ගායනයක් හෝ වාදනයක් ඉදිරිපත් කිරීමේ දී යොදා ගත යුතු සුදුසුම භාණ්ඩ යුගල වන්නේ
(1) තාම්පුරාව හා සිතාරය වේ.
(2) වයලීනය හා තබලාව වේ.
(3) තබලාව හා ඔටනලාව වේ.
(4) තාම්පුරාව හා තබලාව වේ.
(5) ඔටනලාව හා වයලීනය වේ.
(.....)

8. ආසාවරි රාගයේ මේල ස්වර වනුයේ,
(1) සරිගමපධුනි
(2) සරිගුමපධුනි
(3) සරිගුමපධනි
(4) සරිගුම්පධුනි
(5) සරිගුමපධුනි
(.....)

9. ශාස්ත්‍රීය අංග වන ආලාප , තානාලංකාර , තබලා බෝල් ආදිය ඇතුළත් රාගධාරී ශාස්ත්‍රීය පදනමක් සහිත සරල ගීතයක් වනුයේ,
(1) මුව මුක්තාලතා
(2) දුරස් වන්නට මේ ලෙසින්
(3) කමලාසනී
(4) වස්දඩු රාවේ
(5) සඳ සරා කුමාරී
(.....)

10. **කොහිනූර්** චිත්‍රපටයේ එන **මධුබනමේ රාජිකා** ගීතය නිර්මාණයට පදනම් වී ඇති රාගය වන්නේ,
(1) මාලකෞන්ස් රාගය වේ.
(2) භෛරවී රාගය වේ.
(3) හමීර් රාගය වේ.
(4) ඛමාජ් රාගය වේ.
(5) ශිවරංජනී රාගය වේ.
(.....)

11. **''නිති විදිමු සුමධුර යමන රාග රස''** යන සිංහල ලක්ෂණ ගීතය ඇතුළත් ග්‍රන්තය හා එහි කර්තෘ වනුයේ,
(1) භාවික ගීත - වින්සන්ට් සෝමපාල
(2) බ්‍යාල් ගීත - ආනන්ද ජයසිංහ
(3) ගාන විද්‍යා - ආනන්ද ජයසිංහ
(4) භාවික ගීත - බී.එස් විජේරත්න
(5) සංගීත සංහිතා - විමල් අභයසුන්දර
(.....)

12. ආරෝහණයේ ගාන්ධාරය හා නිශාදය වර්ජිත නිර්දේශිත රාගය කුමක් ද?
(1) ජෞනපුරී
(2) හංසධ්වනි
(3) ජයජයවන්ති
(4) ආසාවරී
(5) භෛරව
(.....)

13. තාලයකට අයත් සියලු විභාගයන් වල මාත්‍රා මිශ්‍රව යෙදී ඇති තාලය වනුයේ,
(1) දිප්චන්දි තාලය
(2) තිලවඩා තාලය
(3) ජප් තාලය
(4) ත්‍රී තාලය
(5) ධමාර් තාලය
(.....)

14. දේස් හා මාලකෞන්ස් යන රාග දෙකෙහි සමානතාවයක් පෙන්නුම් කෙරෙන කරුණු ඇතුළත් වරණය තෝරන්න.
(1) මේලය
(2) සංවාදී ස්වර
(3) වාදී ස්වර
(4) ගානසමය
(5) රාග ජාතිය
(.....)

15. අදාරංග හා සදාරංග යන සංගීතඥයින් විසින් ප්‍රබන්ධිත උතුරු ඉන්දීය ගායන ශෛලීන් ලෙස සැලකෙන්නේ,
(1) තරාණා හා ඨුමරී
(2) ධ්‍රැපද් හා ධමාර්
(3) භජන් හා ගසල්
(4) කව්වාලි හා ටප්පා
(5) චොටා බ්‍යාල් හා බඩා බ්‍යාල්
(.....)

16. රාගධාරී ශාස්ත්‍රීය වාදනයක දී **යොදාගත නොහැකි** තානාලංකාර විශේෂයකි.
(1) ශුද්ධ තාන
(2) බෝල් තාන
(3) මිශ්‍ර තාන
(4) කූට තාන
(5) අලංකාරික තාන
(.....)

17. තබලා වාදනයක දී එහි තාලය පවත්වා ගැනීමට උපකාරී වන ලෙස නිර්මාණය කරන ලද තාලානුකූල ස්වර රචනාව හඳුන්වන නාමය වනුයේ,
(1) තිහායි යනුවෙනි. (2) චක්‍රධාර් යනුවෙනි. (3) පරන් යනුවෙනි.
(4) ලෙහෙරා යනුවෙනි. (5) රේලා යනුවෙනි. (.....)

18. උත්තර භාරතීය - දක්ෂිණ භාරතීය සංගීත පද්ධති දෙකටම අදාළ කල හැකි තොරතුරු තෝරන්න.
(1) මාර්ග සංගීතය තුළින් බිහිවී ඇත. (2) භාෂාව, කාල පද්ධතිය,සංගීත භාණ්ඩ සමානය.
(3) ශුද්ධ හා විකෘති ස්වර 12 ක් යොදා ගනී. (4) ගායනය සඳහා ප්‍රමුඛ ස්ථානයක් ලබා දීම.
(5) ගීත ආකෘතිය ස්ථායි, අන්තරා, සංචාරී, ආභෝග ලෙස යෙදේ. (.....)

- **පහත ගී පාද ඇසුරු කර ගනිමින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
  A. ඛඹරු අඩන්නේ සුදු මොර මල් කැකුලේ
  B. ඉන්නෙත් දුම්බරයි මහ කළු ගලක් යට
  C. රත්තරං පනේ නුඹ එවූ පත දුටුවා
  D. මන්දාරමට උඩ ඉගිලෙන වැහිලේනි
  E. කැකුළු සහල් පිටියෙන්ද

19. ගැමි ජීවන රටාවේ පැවැති සාරධර්ම ලක්ෂණ පිළිඹිබු වන ජන ගීත පාදය වනුයේ,
(1) A (2) B (3) C (4) D (5) E (.....)

20. "**බෙගම පර්වින් සුල්තානා** " නම් හින්දුස්ථානී සංගීතවේදිණිය ,
(1) ගසල් ගායිකාවක ලෙස ප්‍රකටය (2) ශාස්ත්‍රීය සංගීතයේ රැජින ලෙස ප්‍රකටය.
(3) දක්ෂ සිතාර් වාදිකාවක ලෙස ප්‍රකටය. (4) මුර්චනා තුනී ගායන ශිල්පිනියක ලෙස ප්‍රකටය.
(5) දක්ෂ සන්තූර් වාදිකාවක ලෙස ප්‍රකටය. (.....)

21. ඔපෙරා නිර්මාණයේ නිජ බිම ලෙස සැළකෙනුයේ,
(1) ඉතාලිය වේ. (2) ජර්මනිය වේ. (3) ඕස්ට්‍රියාව වේ.
(4) ස්පාඤ්ඤය වේ. (5) ප්‍රංශය වේ. (.....)

- අංක 22 හා 23 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත සඳහන් ස්වර පාදය උපයෝගී කරගන්න.
  ප - ග්‍රම / ප්‍රධ නිධ ප්‍රම / ග - රි / ස - -

22. ඉහත ස්වර පාදය අපරදිග සංගීත ප්‍රස්තාරකරණය අනුව ලිවීමේ දී ඒ සඳහා යොදාගත හැකි clef සංකේතය හා තාල සංකේතය **(Time Signature)** වනුයේ ,
(1) Treble Clef - 3/4 Time (2) Bass Clef - 3/4 Time
(3) Treble Clef - 4/4 Time (4) Treble Clef - 6/8 Time
(5) Bass Clef - 7/8 Time (.....)

23. ඉහත ස්වර පාදය B^b major scale අනුව නිවැරදිව ලියා ඇති ස්වර පාදය,
(1) ම - රිග /මප ධනි ධප /ම - රි /ස - - (2) ම - රිග /මප ධප මග /රි - ස /නි - -
(3) ම - රිග /මග ප්‍රධ ප්‍රම /ග - රි /ස - - (4) ම - රිග /මප ධප මග /රි - ග /ස - -
(5) ම - රිග /මප ධප මග /රි - ස /නි - - (.....)

24. උඩරට , පහතරට , සබරගමු නර්තන සම්ප්‍රදායවල පොදුවේ භාවිත අවනද්ධ භාණ්ඩය ,
(1) මද්දලය වේ. (2) යක්බෙරය වේ. (3) තබලාව වේ.
(4) මෘදංගය වේ. (5) දවුල වේ. (.....)

25. අපරදිග සංගීතයේ මේජර් හා මයිනර් ස්කේල්ස් හා වඩාත් සමාන වන හින්දුස්තානී ථාට වනුයේ,
(1) බිලාවල් හා ආසාවරී ථාටය
(2) බමාජ් හා භෛරවී ථාටය
(3) බිලාවල් හා කාෆි ථාටය
(4) කාෆි හා භෛරවී ථාටය
(5) බිලාවල් හා භෛරවී ථාටය
(.....)

26. ඉන්දියාවේ නයි නැටවීමෙන් ජීවත් වූ විරාව ගෝත්‍රිකයින් ගැයූ ගී අනුසාරයෙන් නිර්මාණය වූ රාගය වනුයේ,
(1) භෛරව (2) තක්ක (3) සාවරී
(4) පහාඩි (5) අභීර්
(.....)

27. ධර්මදාස වල්පොල ගයනු ලබන සාම්ප්‍රදායක කවි නාද රටා අනුව නිර්මාණය වී ඇති චිත්‍රපට ගීතය,
(1) කමලාසනී (2) පිපී පිපී රේණු නටන (3) කොවුලන් හඬයි
(4) කටේ කිරි සුවඳ (5) ගලන ගඟකි
(.....)

28. පහත සඳහන් මූලික කෝඩස් තුනෙහි එක් ස්වරයක් බැගින් අඩුය. එම ස්වර තුන පිළිවෙළින්,
ස - ප , ප නි - , - ධ ස
(1) රි ම ග (2) ග ම රි (3) ම ග රි
(4) රි ග ම (5) ග රි ම
(.....)

29. පැල් ගී , නැළැවිලි ගී , පැරු ගී , ගැල් ගී යන ගී වර්ග හතර සඳහාම පොදුවේ අදාළ වන නිවැරදි කියමන තෝරන්න.
(1) සියලු ම ගීත සමූහ වශයෙන් ගැයේ.
(2) සියලු ම ගීත ආඝාතාත්මකව ගැයේ.
(3) සියලු ම ගීත ඒකලව ගැයේ.
(4) සියලු ම ගීත සමාජ ගී ගණයට අයත් වේ.
(5) සියලු ම ගීත මෙහෙ ගී ගණයට අයත් වේ.
(.....)

30. සිංහල සාහිත්‍යයේ මුල්ම හටන් කාව්‍යය වශයෙන් සැලකෙනුයේ,
(1) මහ හටන (2) කොන්ස්තන්තිනු හටන (3) පරංගි හටන
(4) ඉංග්‍රීසි හටන (5) දුනුවිල හටන
(.....)

• 31 සිට 34 තෙක් ප්‍රශ්න සඳහා පහත ඡේදය කියවා අදාළ පිළිතුරු තෝරා ගෙන හිස්තැන් පුරවන්න.
කුමුදිකා තම සංගීත භාණ්ඩය වැයීමට පෙර අළුයෙහි රෝසින් තවරාගෙන කෝමළ ස්වර තුනක් යෙදෙන රාගයක් වාදනය කිරීමට පටන් ගත් අතර , ඇයගේ භාණ්ඩයේ කෝමළ රිෂභය සඳහා පර්දාවක් නොවිය. ආරෝහණයෙහි ගාන්ධාර ස්වරය පමණක් වර්ජිත කොට අවරෝහණයෙහි ස්වර හතම යොදා ගනිමින් විවිධ තාන රැසක් වයමින් ජලා හා නිහායි ද වයා වාදනය අවසන් කරන ලදී.

31. ඇය වැයූ භාණ්ඩය නම් කරන්න. .....

32 ඇය වැයූ රාගය නම් කරන්න. .....

33. ඇය වැයූ වාදන ශෛලිය කුමක්ද? .....

34. ඇය වයන ලද රාගයට සම්ප්‍රකෘති රාගය කුමක්ද? .....

• 35 සිට 50 තෙක් ප්‍රශ්නවල ඇති හිස්තැන් සඳහා සුදුසුම පිළිතුර යොදන්න.

35. නිර්දේශිත රාග දෙකක් වන ..... හා ..... රාගයෙන් බ්‍යාල් ගායනා සිදුකිරීමේ දී කාම්පුරාවේ තත් හතර ම් ඵ ස ස ලෙස සුසර කරනු ලැබේ.

36. චතුර් වේදය අතුරින් සංගීතය හා සම්බන්ධ වේදය ..... ලෙස හඳුන්වනු ලබන අතර, වෛදික ස්වර තුන ..... , අනුදාත්ත, ස්වරිත ලෙස හැඳින්වේ.

CP/AL/2026/54-II

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අ.පො.ස (උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2026

පෙරදිග සංගීතය II	54	S	II	13 ශ්‍රේණිය	පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

උපදෙස් -

- I කොටසින් ප්‍රශ්න දෙකකට ද, II කොටසින් එක් ප්‍රශ්නයකය ද, III කොටසින් ප්‍රශ්න දෙකකට ද, වශයෙන් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. (සෑම ප්‍රශ්නයකට ම ලකුණු 20 බැගින් ලැබේ.)

I කොටස

1. පහත දැක්වෙනුයේ නිර්දේශිත රාග හතරකට අයත් ස්වර සංගති කිහිපයකි.

   A. ස ම, මපධහු, මහුරිස
   B. ස නි රි ග ප රි, ස ගරි නි ප
   C. නි ස, රිහුරි ස, ස, ධ නි රි
   D. රි මපනි්‍ධ ප , මපධු මප ,හු රි ස

   (i) ඉහත ස්වර සංගතීන් අයත් වන රාග හඳුනාගෙන, අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග නම් කරන්න. (ලකුණු 04යි.)
   (ii) ඉහත A,B සහ C හි ඇතුළත් සංගති මඟින් පිළිබිඹු වන රාග තුනෙන් කැමති රාගයකට අදාල බ්‍යාල් මධ්‍යලය ගීතයෙහි හෝ වාදිතයෙහි හෝ ස්ථායී කොටස පමණක් ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 06යි.)
   (iii) ඉහත D අක්ෂරයෙන් දැක්වෙන රාගයට අදාළ මාත්‍රා අටකට නොඅඩු තානාලංකාර දෙකක් ලියන්න. (ලකුණු 04යි.)
   (iv) ඉහත දැක්වෙන රාග අතුරින් සම්ප්‍රකෘති රාගයක් හඳුනාගෙන එම රාගයේ සම්ප්‍රකෘති රාගය නම් කර, සමානතා **තුනක්** සහ අසමානතා **දෙකක්** ලියන්න. (ලකුණු 06යි.)

2. නිර්දේශිත රාග කිපයක විශේෂිත ලක්ෂණ කිපයක් පහතින් දැක්වේ.

   A. ආරෝහණයේ දී ග, ධ දුර්වල වන අතර, ර්ගුර් ලෙස කෝමළ ග ස්වරය විවාදී ස්වරයක් ලෙස යොදා ගනී.
   B. රිෂභය හා ධෛවතය ආන්දෝලනය කරනු ලබන අතර , කෝමළ නිෂාදය විවාදී ස්වරයක් ලෙස යොදා ගැනේ.
   C. පංචමය අවරෝහණයේ දී වක්‍රව යෙදෙන අතර දේස් රාගයට සම්ප්‍රකෘති රාගයකි.
   D. රිෂභය හා ධෛවතය ආන්දෝලනය නොකරන අතර, ගාන්ධාරය මත බොහෝ විට න්‍යාස කෙරේ.

   (i) එම ලක්ෂණ වලින් පිළිබිඹු වන රාගවල නම් අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමග ලියා දක්වන්න. (ලකුණු 04යි.)

(ii) ඉහත A,B අක්ෂර වලින් දැක්වෙන රාග අතුරෙන් කැමති රාගයකට අදාළ බ්‍යාල් මධ්‍යලය ගීතයෙහි හෝ වාදිතයෙහි හෝ අන්තරා කොටස ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 06යි.)

(iii) ඉහත A,B අක්ෂර වලින් දැක්වෙන රාග දෙක සඳහා අලංකාරික තාන හා කූට තාන එක බැගින් ලියන්න. (ලකුණු 04යි.)

(iv) නිර්දේශිත රාග අතුරින් හෙරව ඨාටයට අයත් සමප්‍රකෘති රාග යුගලය නම් කර, එම රාග දෙකෙහි සමානතා **දෙකක්** රාග සංගති ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06යි.)

3. නිර්දේශිත හින්දුස්ථානී තාල තුනක දැකිය හැකි ලක්ෂණ තුනක් පහතින් දැක්වේ.

A. සම්පූර්ණ මාත්‍රා ගණන 12 ක් ඇති අතර, විභාග 06 ක් ඇත. යේකාව පබාවජ් අක්ෂරයන්ගෙන් නිර්මාණය වී ඇත.

B. සම්පූර්ණ මාත්‍රා ගණන 16 ක් ඇති අතර, විභාග 04 ක් ඇත. යේකාව තබලා අක්ෂරයන්ගෙන් නිර්මාණය වී ඇත. ධ්‍රුමරි හා ටප්පා ගායනය හා ධ්‍රුන් වාදනය සඳහා යොදාගනී.

C. සම්පූර්ණ මාත්‍රා ගණන 14 ක් ඇති අතර, විභාග 04 ක් ඇත. සෑම විභාගයක් තුළම නිශ්ශබ්ද මාත්‍රාවක් ඇත.

(i) ඉහත හින්දුස්ථානී තාල පද තුන නිවැරදිව ඉංග්‍රීසි අක්ෂරය ද සමග ලියන්න. (ලකුණු 03යි.)

(ii) ඉහත A අක්ෂරයෙන් දැක්වෙන තාල පදය නිවැරදිව තාල සංඥා ද සමග ප්‍රස්තාර කරන්න. (ලකුණු 05යි)

(iii) ඉහත තාල අතුරෙන් C අක්ෂරයෙන් දැක්වෙන තාලයේ යේකාව සමගුණ සහ දෙගුණ වශයෙන් තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ලකුණු 06යි)

(iv) ත්‍රි තාල් හා තිලවාඩා යන තාල දෙකෙහි දැකිය හැකි සමානතා හා අසමානතා තුන බැගින් ලියන්න. (ලකුණු 06යි)

II කොටස

4. පහත දැක්වෙන්නේ නිර්දේශිත ජන ගී වලට අයත් ගී පාද කිපයකි.

(a) සුරිදුන් පෙර සිටන් - බල යුත් සැවති දුන්

(b) ලේසි නොව බැඳ අල්ලා

(c) සූරිය උදාවන තුරු පිනි බෑවිල්ල

(i) (a) , (b) සහ (c) යන ගී පාද අයත් වන ගී වර්ග හඳුනාගෙන වෙන වෙන ම නම් කරන්න. (ලකුණු 06යි)

(ii) ඉහත (a) සහ (b) යන ගී වර්ග වල සමාන ලක්ෂණ හතරක් ලියා දක්වන්න. (ලකුණු 04යි)

(iii) ගැමි ගීය තුළින් දාර්ශනික බව, සමාජයේ සාමූහික බව, සාරධර්ම අගය කිරීම වැනි ලක්ෂණ ඉස්මතු වන අවස්ථා උදාහරණ තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

(iv) (c) වර්ගයට අයත් ගී වර්ගයේ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 04යි)

5. **"ලංකේය සංගීත ඉතිහාසයේ නාඩගම් සහ නූර්ති කලාවන්ට සුවිශේෂී ස්ථානයක් හිමිවේ."**

(i) නූර්ති හා නාඩගම් අතර සන්සංදනාත්මක විග්‍රහයක් පහත දැක්වෙන කරුණු ඔස්සේ විග්‍රහ කරන්න.

- සංගීතමය ලක්ෂණ
- සංගීත භාණ්ඩ හා යොදාගනු ලබන තාල
- ගීත ආකෘතිය

(ලකුණු 06යි)

(ii) නිර්දේශිත නූර්ති ගීතයක ස්ථායී කොටස ගීත ස්වර ප්‍රස්තාර කර දක්වන්න. (ලකුණු 04යි)

(iii) මහනුවර යුගයේ සංගීත විකාශයට දකුණු ඉන්දියානු සංගීතයේ බලපෑම පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 06යි)

(iv) පහත සඳහන් කරුණු අතුරින් මාතෘකා දෙකක් පිළිබඳ උදාහරණ දෙමින් කෙටි විස්තරයක් කරන්න.
තෝඩයම , ඉන්නිසිය , උරුට්ටුව (ලකුණු 04යි)

III කොටස

6.



(i) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කරන්න. (ලකුණු 04යි.)

(ii) පෙරදිග ක්‍රමයට පෙරලූ එම ප්‍රස්තාරයේ විභාග සඳහා අනුකූල සංඝාත (Chords) ලියන්න. (ලකුණු 08යි.)

(iii) ඉහත පෙරදිග ස්වර ප්‍රස්තාරය මධ්‍යමභාවයට පරිවර්තනය කරන්න. (ලකුණු 04යි.)

(iv) බටහිර සංගීතඥ බීතෝවන් ගෙන් සංගීත ක්ෂේත්‍රයට සිදුවූ සේවාවන් **හතරක්** ලියන්න. (ලකුණු 04යි.)

7. **" මෙරට ව්‍යවහාරික සංගීතයේ ජනප්‍රිය වූ ගීත කලාවක් ලෙස කණ්ඩායම් සංගීතය හැඳින්විය හැකිය."**

(i) කණ්ඩායම් සංගීතය පිළිබඳ කෙටි හැඳින්වීමක් පහත කරුණු ඔස්සේ විග්‍රහයක් කරන්න.

- ආරම්භය
- මුල් යුගයේ සංගීත කණ්ඩායම් හා නිර්මාණ
- කණ්ඩායම් ගීත අභාවයට යෑමට හේතු (ලකුණු 08යි)

(ii) මුල් යුගයේ චිත්‍රපට වලට දායක වූ සංගීත අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු හා ගායිකාවන් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 06 යි)

(iii) සරල ගී ආකෘතියේ දැකිය හැකි පහත දැක්වෙන විශේෂාංග වලින් **තුනක්** පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

Bits, Adlib, Counter Points, Introduction, interludes (ලකුණු 06යි)

8.

(i) භාරතීය සංගීතයේ ප්‍රභවයට වේද ගායනා බලපා ඇති ආකාරය පිළිබඳව උදාහරණ දෙමින් විග්‍රහයක් කරන්න. (ලකුණු 08යි)

(ii) පහත සඳහන් මාතෘකා තුනක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

- හාත්ඛණ්ඩේ පඩිතුමාගෙන් සංගීතයට සිදුවූ සේවය
- ගසල් ගායන ශෛලිය
- සිම්පනි
- බ්‍යාල් ගායන ශෛලිය

(ලකුණු 3 × 4 = 12)

***

CamScanner

අ.පොස (උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය - පෙරදිග සංගීතය 2026

පිළිතුරු පත්‍රය I කොටස

(1) 1
(2) 3
(3) 4
(4) 2
(5) 1
(6) 5
(7) 4
(8) 2
(9) 3
(10) 3
(11) 1
(12) 4
(13) 5
(14) 4
(15) 5
(16) 2
(17) 4
(18) 3
(19) 1
(20) 2
(21) 1
(22) 1
(23) 2
(24) 5
(25) 1
(26) 1
(27) 4
(28) 5
(29) 3
(30) 2

(31) එස්රාජ් / දිල්රුබා
(32) ජෞනපුරි
(33) බ්‍යාල්
(34) ආශාවරී
(35) මාලකෞන්ස් / බාගේශ්‍රී
(36) සාම වේදය / උදාන්ත
(37) බඩා බ්‍යාල් / ධමාර්
(38) සුළු මහ දෙතිත / මැදුම් හෝ කඩිනම් මැදුම්
(39) නිසාතිය / දරණකය
(40) වන්නම් / ටීකා සී පද
(41) දෙලොවත් අතර / ස්පාඤ්ඤ
(42) අඩුතාල් / වැඩි තාල්
(43) Cubase , nuendo , Adobe Audition /Sound card / Speaker / Microphone
(44) w q e / / e r w t
(45) W.B මකුලොලුව / ආචාර්ය ලයනල් එදිරිසිංහ
(46) කෝට්ටේ / මහනුවර
(47) ශිවරංජනී / භෛරවී
(48) බීතෝවන් / මෝර්සාට්
(49) හොවාර්ඩ් ගාඩ්නර් /සංගීත රිද්මයානුකූල
(50) බෙම්ටෝ / කෙහෙර්වා

II කොටස - පිළිතුරු

I කොටස

1.

(i)

A. බාගේශ්‍රී
B. හංසධ්වනි
C. ජයජයවන්ති
D. ආශාවරී

(ii) නිවැරදිව බ්‍යාල් මධ්‍යලය ගීතයක්/ වාදිතයක් නිවැරදිව ප්‍රස්තාර කර තිබීම.

(iii) නිවැරදිව තානාලංකාර දෙකක් ලියා තිබීම.

(iv) <u>සමානතා</u>

- ඨාටය සමාන වීම , වාදී - සංවාදී සමාන වීම , ගානසමය සමාන වීම , උත්තරාංගවාදී රාග යුගලක් වීම..... ආදී ලෙස සමාන කරුණු තුනක් ලියා තිබීම.

<u>අසමානතා</u>

- රාග ජාතිය අසමාන වේ. (ආසාවරී- ඕඩව සම්පූර්ණ , ජෞනපුරී - ෂාඩව සම්පූර්ණ) , ආසාවරී රාගයේ ආරෝහණයේ දී යොදා නොගන්නා අතර ජෞනපුරී රාගයේ ආරෝහණයේ දී කෝමල නිෂාදය යොදා ගැනේ. , ආසාවරී ධෛවතය ප්‍රබල වන අතර ජෞනපුරී රාගයේ කෝමළ නිෂාදය වැඩි වශයෙන් යොදා ගැනේ , ...

PAST PAPERS WIKI

Past Papers Wiki

2.

(i)

A. දේස්
B. හෙරව
C. තිලක්කාමෝද්
D. කාලිංගඩා

(ii) මධ්‍යලය ගීතය හෝ වාදිතයක අන්තරා කොටස නිවැරදිව තාල සංඥා යොදමින් ප්‍රස්තාර කිරීම.

(iii) රාග දෙකට අදාළ පරිදී නිවැරදිව අලංකාරික හා කුට තාන් එක බැඟින් ලියා තිබීම.

(iv) සමප්‍රකෘති රාග යුගල -හෙරවී - කාලිංගඩා
සංගති දෙකක් ඇසුරින් සමප්‍රකෘති බව පැහැදිලි කිරීම

3.

(i)

A. චෞතාල්
B. පංජාබ්
C. දීප්චන්දි

(ii)

1	2	3	4	5	6	7	8	9	10	11	12
ධා	ධා	සිං	තා	කිට	ධා	සිං	තා	තිට	කත	ගධි	ගෙන
X		0		2		0		3		4	

(iii)

1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14
සමගුණ													
ධ	සිං	-	ධ	ධ	සිං	-	ත	තිං	-				
දෙගුණ										ධ	ධ	සිං	-
ධසිං	-ධ	ධසිං	-ත	තිං-	ධධ	සිං-	ධසිං	-ධ	ධසිං	-ත	තිං-	ධධ	සිං-
X			2				0			3			

(iv) <u>සමානතා</u>

- මාත්‍රා 16 යි
- විභාග 4 යි
- තාල සංඥා සමානයි (x/2/0/3)
- යේකාවේ තබ්ලා අක්ෂර තිබීම .....

<u>අසමානතා</u>

- යේකාවේ අක්ෂර අසමානයි.
- ත්‍රිතාලය විලම්භ , මධ්‍ය , දෘත යන ලයාකාර වල වාදනය වේ. තිලවාඩා අතිවිලම්භ , විලම්භ අකාරයෙන් වාදනයවේ.
- ත්‍රි තාලය ඒකල වාදනය කෙරේ. තිලවාඩා ඒකල වාදනය නොවේ.

4.

(i)

A. <u>වන්නම්</u>
B. <u>හටන්</u>
C. <u>පාරු කවි</u>

(ii)

- සේගී ගණයට අයත්වීම
- ස්වර පරාසය පුළුල් වීම.
- ලිඛිත වීම.
- භාෂාව නැඹුරු වීම ආදී ලෙස කරුණු 4 කි ලියා තිබීම

(iii) උදාහරණ තුනක් ඇසුරින් විග්‍රහ කර තිබීම

(iv)

- ගැමි ගී ගණයට අයත්වීම
- අනාඝාතාත්මක බව
- ඉහල හඬකින් ගැයීම
- මෙහෙගී ගණයට අයත්වීම ..... ආදී ලෙස නිවැරදි කරුණු 4 ක් ලියා තිබීම.

5.

(i) අදාළ කරුණු ඔස්සේ විග්‍රහ කර තිබීම.

(ii) නිර්දේශිත නූර්ති ගීතයක් නියමිත පරිදී ස්ථායී කොටස ස්වර ප්‍රස්තාර කර තිබීම.

(iii) උදාහරණ සහිතව කරුණු විස්තර කර තිබීම.

(iv) දෙකක් පිළිබඳ කෙටි විස්කර ලියා තිබීම.

6.

(i)

+ + /w w / , , - .q	t - et , - -	r - wr + + +	e - qe w q .

(ii) C / F / G / F
C / C / +++ / G
C /

(iii)

+ + et t e q q - w4	i - yi q - -	u - tu + + +	y - 4y t 4 w

(iv) බීතෝවන් ගෙන් බටහිර සංගීතයට සිදුවූ සේවාවන් 4 ක් ලියා තිබීම.

7.

(i) අදාළ කරුණු ඇතුළත්ව කණ්ඩායම් සංගීතය පිළිබඳ විස්තරයක් ලිවීම.

(ii) මී මැස්සෝ - මුළු ගතම වෙහෙසුනා
ත්‍රී සිස්ටර් - ඔබ සොයනා කළු කෙල්ල මමයි
ජිපිටස් - කුරුමිට්ටෝ .....

(iii) විශේෂ කොටස් තුනක් පිළිබඳ කරුණු ලියා තිබීම.

8.

(i) කරුණු 4ක් ඔස්සේ කරුණු විග්‍රහ කිරීම.

(ii) මාතෘකා තුනක් පිළිබඳ කෙටි සටහන් ලියා තිබීම.

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank